මාධ්‍ය නිවේදන අංක :**LAE/2024/EPS/23**

**2024.10.17**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2024.10.26
## ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

### ඡන්දදායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණ සළකුණු කිරීම

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ (2024) දී ඡන්දදායකයාගේ වම් අතෙහි සුළැඟිල්ල උචිත ලකුණින් සළකුණු කර ඇති බැවින්, 2024.10.26 දින පැවැත්වීමට නියමිත ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ දී, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 53අ(3) වගන්තියෙන් ඡන්දදායකයා උචිත ලකුණින් සළකුණු කිරීම සම්බන්ධයෙන් මතුවිය හැකි ගැටළුව නිරාකරණය කිරීම සඳහා ඡන්දදායකයාගේ වම් අතෙහි මහපටඟිල්ල උචිත ලකුණින් සළකුණු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කොට ඇත.

ඡන්දදායකයාගේ වම් අතෙහි මහපටඟිල්ල නොමැති නම් ඔහුගේ දකුණු අතෙහි මහපටඟිල්ල හෝ වෙන යම් ඇඟිල්ලක් උචිත ලකුණින් සළකුණු කිරීමට තීරණය කළ බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්